# ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැඳුරෙහි ඓතිහාසික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

**ආර්.එම්.වී.ඕ. රත්නායක[1]**

ප්‍රමුඛ පද: ඓතිහාසික, කතෝලික, ගාල්ල, දේවස්ථානය, යටත් විජිත

## හැඳින්වීම

ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැදුර වසර 150 ක් පමණ ඉතා පැරණි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත දේවස්ථානයකි. දකුණු පළාතෙහි ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 96 සී කළුවැල්ල ග්‍රාම නිලධාරී වසමට යටත්ව කළුවැල්ල ග්‍රාමයෙහි මෙය පිහිටා ඇත. මෙම දෙව්මැදුරට ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පොලේ සිට ගාල්ල කොළඹ මාර්ගයේ 600m පමණ ගමන් කර දකුණු දෙසට ඇති ආසන දෙව්මැදුර මාර්ගය ඔස්සේ 300m පමණ කුඩා කඳු ගැටයක් තරණය කිරීමෙන් ළඟා විය හැකිය. සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාධක මත පදනම්ව මෙම දේවස්ථානයෙහි ඓතිහාසික වැදගත්කම, සංස්කෘතික හා ආගමික ඉතිහාසය පෙළ ගැස්වීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී ශ්‍රී ලංකාව තුළ විවිධ දේවස්ථාන බිහි වුව ද ඒ අතරින් ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැදුර යනු සිල්වෙස්ත්‍රෝ බෙනදික්තානු සමය තුළ නිර්මාණය වූ රෝමානු කතෝලික දේවස්ථානයකි. වර්තමානය දක්වා ම සජීවීව පවතින මෙම දේවස්ථානයේ විවිධ අවධීන් තුළ නඩත්තු කටයුතු, නව ඉදිකිරීම් වැනි බොහෝ වෙනස්කම්වලට භාජනය වී ඇත. ඒ අනුව මෙම ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැදුරෙහි ඓතිහාසික පසුබිම කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන ගැටලුව වේ.

## ක්‍රමවේදය

මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යොදා ගනු ලැබූ අතර, අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීමට හා තොරතුරු රැස් කිරීම සඳහා මූලාශ්‍ර පරිශීලනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයන මාතෘකාවට ඍජුව ම සම්බන්ධ වන පර්යේෂණ සොයා ගැනීමට අපහසු වුව ද අධ්‍යයන මාතෘකාවට සම්බන්ධ ව ලියැවී ඇති ද්විතීක මූලාශ්‍ර අධ්‍යයනය කරමින් තොරතුරු ලබා ගැනීම සිදුකර ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ ඓතිහාසිකමය තොරතුරු, ආගමික හා සංස්කෘතික වටිනාකම පිළිබඳ පූජා ප්‍රසාදීන් වහන්සේලාගෙන් හා මීසම් ප්‍රජාව සමඟ සම්මුඛ සාකච්ඡා සිදුකර තොරතුරු රැස් කර ගන්නා ලදි.

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
rvinuji@gmail.com

එසේ ලබාගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණය කර සටහන්, ඡායාරූප, සැලසුම්, වගු මඟින් ඉදිරිපත් කරමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම පර්යේෂණය ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැදුරෙහි මූලාරම්භය විමර්ශණය කිරීමේදී ශ්‍රී ලංකාව තුළ කතෝලික ධර්මයේ ආරම්භය හා එය දේවස්ථාන ඉදිවීම දක්වා වූ ගමන් මග පිළිබඳව අධ්‍යයනය කරයි. මෙය පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය, පෘතුගීසි යුගය, ලන්දේසි යුගය හා බ්‍රිතාන්‍ය යුගය ඔස්සේ ඉදිරිපත් කර ඇති අතර එහි බලපෑම ගාල්ලෙහි දේවස්ථානයක් ඉදිවීමට හේතු වූයේ කෙසේද යන්න පිළිබඳ විග්‍රහ කර ඇත. ක්‍රි.ව. 1874 ආරම්භ කරන ලද මෙම ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැදුර දිවයිනේ යටත් විජිත සහ ආගමික ඉතිහාසය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සන්ධිස්ථානයක් ලෙස දැක්විය හැකි ය. මෙම දේවස්ථානය රෝමානු කතෝලික දේවස්ථානයක් වන බැවින් මෙහි ඉතිහාසය පෘතුගීසි යුගය දක්වාම දිවයයි. එනම්, ශ්‍රී ලංකාවේ කිතු දහමේ ආරම්භය සිදුවන්නේ ක්‍රි.ව. 1505 පෘතුගීසීන්ගේ ආගමනයත් සමඟ ය. මෙසේ ආරම්භ වූ කිතු දහම විශාල වශයෙන් මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත වන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙහි ද විවිධ දේවස්ථාන ඉදිකරමින් ධර්මය ප්‍රචාරය කර ඇත. මෙම අඩිතාලම යටතේ ක්‍රි.ව. 1658 ලන්දේසි යුගයෙහිද විවිධ අභියෝග හමුවේ පවා ධර්මදූතවරුන්ගේ කැපවීම මත කිතු දහම නොනැසී ඉදිරියට පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. ක්‍රි.ව. 1765 ආරම්භ වූ ලන්දේසීන් සහ උඩරට රාජ්‍යය අතර පැවැති සිවිල් යුද්ධය හේතුවෙන් කතෝලිකයන්ට වැඩි නිදහසක් ලැබීමට අවස්ථාව හිමි වී ඇත. මේ හේතුවෙන් කතෝලික ධර්මය ඇදහීමට තහනම් කරන ලද නීතිවලින් ඔවුන් නිදහස් කර ඇත (දසනායක, 2021). මෙසේ ලන්දේසි යුගයේ අවසන් වසර වන විට කොටහේන, ගාල්ල වැනි ස්ථානවල රජයේ අනුග්‍රහයෙන්ම දේවස්ථාන ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් ප්‍රදානය කරදුන් බව සඳහන් වේ (දසනායක, 2021). මෙසේ වත්මන් ගාල්ල ආසන දෙව්මැදුර පිහිටා ඇති කල්වාරි කන්ද නම් භූමිය එකල ලන්දේසින් විසින් දඬුවම් පමුණුවන ලද පෝරක ගොඩැල්ල නම් ස්ථානයේ කතෝලිකයන් හට සිය ආගමික වත් පිළිවෙත් සිදු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන ලදී. විවිධ ධර්මදූතවරුන් විශාල ප්‍රමාණයක් මෙරටට පැමිණ නොකඩවා ධර්මය ප්‍රචාරය කර ඇති බවත්, දක්ෂිණ ප්‍රදේශයේ ගාල්ල, මාතර සහ හම්බන්තොට වැනි ප්‍රදේශවල ධර්මදූතික මධ්‍යස්ථානය පිහිටා තිබූ බවත් සඳහන් වේ (දසනායක, 2021).

ඒ අනුව ගාල්ලේ කඳු ගැටය මත ජපමාලයේ අප ස්වාමී දූ හට කැප කරන ලද දේවස්ථානයක් ඉදි කර ඇති බවත්, 1865 වර්ෂය පමණ වන විට පැවති දේවස්ථානය අබලන්ව තිබූ බැවින් නව දේවස්ථානයක් ඉදි කිරීම ආරම්භ කරන ලදී. එය සිල්වෙස්ත්‍රෝ බෙනදිකානු නිකාය සමය තුළ ස්පාඤ්ඤය ජාතික ගෞරව බෙනඩික්ට් මාර්ටින් පූජා ප්‍රසාදීන් වහන්සේ විසින් වර්තමානයේ දිස්වන ගාල්ල

ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ දෙව්මැදුර ඉදිකරන ලදී. ක්‍රි.ව. 1873 දී ගොඩනැගිල්ලට අත්තිවාරම දැමූ අතර වැඩ කටයුතු ක්‍රි.ව 1874 දී අවසන් වූ බව සඳහන් වේ. මෙම දේවස්ථානය ක්‍රි.ව. 1893 අගෝස්තු මස 25 වන දින 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමාගේ නිල නිවේදනයක් මගින් ආසන දෙව් මැදුරක් බවට පත්කරන ලදී. එමෙන්ම 188 වැනි අධිකාරය වූ පුරාවස්තු ආඥා පණතෙහි 18 වැනි වගන්තිය යටතේ මෙම ආසන දෙව්මැදුර 'ආරක්ෂිත ස්මාරකයක්' වශයෙන් සලකුණු ලැබිය යුතු බවට 2016 අප්‍රේල් මස 12වන දින අංක 1963 දරණ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

## සමාලෝචනය

වසර 150ක් පමණ දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන මෙම ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැදුර යටත් විජිත යුගයේ සිට ශතවර්ෂ ගණනාවක ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික වර්ධනයේ සාක්ෂියක් ලෙස දැක්විය හැකි දේවස්ථානයකි. පෘතුගීසි ආගමනයෙන් ආරම්භ වූ කතෝලික ධර්මයේ විකාශනය හා එය දේශීය සංස්කෘතිය සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ඇතිකරගත් අයුරු මෙහි ඉතිහාසය තුළින් පිළිබිඹුවේ. වර්තමානය දක්වාම ආගමික හා සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වන මෙම දෙව්මැදුරෙහි වටිනාකම හා පෞරාණිකත්වය අවබෝධ කර ගනිමින් මෙම උරුමය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය මෙමගින් අවධාරණය කරයි.

## ආශ්‍රිත මූලාශ්‍රය

කොළමුන්නේ, ටී. (2006). ***සිරිලක් කිතු සසුන*** (දෙවන කාණ්ඩය). බෝලවලාන, ප්‍රැන්සිස්කන් නිවාසය.

දසනායක, එ. (2021). ***බ්‍රිතාන්‍ය යුගයේ දකුණු අනුපදවියේ කතෝලික සභා මෙහෙවර සිල්වෙස්ත්‍රෝ බෙදිකාන දායකත්වය.*** කොළඹ 10: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

දොන් පීටර්, ඩබ්ලිව්.එල්.ඒ. (2008). ***ලක්දිව කතෝලික උදාව.*** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.